**●නාට්‍යමය අවස්ථා සෞන්දර්යාත්මකව විඳ ගැනීම සහ මානව හිතවාදියෙක් ලෙස සමාජ ගත වීමේ හැකියාව ප්‍රදර්ශණය කරයි**

**5.1.1කාළගෝල නාට්‍යයේ කතා වස්තුව හා තේමාව හඳුනාගනිමු.**



දහය ශ්‍රේණියේ නාට්‍ය හා රංගකලාව හදාරනු ලබන ශිෂ්‍ය ඔබ මෙම වසරේ දී රසවිඳින්නට අවස්ථාව උදා කරගනු ලබන නාට්‍ය පිටපත වන්නේ **"දික්තල කාළගෝල"**නාට්‍ය පිටපතයි. ඉතා ඉහළ නාට්‍යමය රසයකින් යුතු මෙම නාට්‍ය පිළිබඳව මීට පෙර එබ අසා තිබෙන්නට ඇතැම් විටෙක නාට්‍ය නරඹා තිබෙන්නට ද පුලුවන. නමුත් මෙම පාඩම ඔස්සේ නාට්‍ය පෙළ පිළිබඳව මනා අවබෝධයක් ලබා ගත් පසුව පෙර නොවිඳි රසයක් නාට්‍ය තුළින් විඳ ගැනීමට හැකියාව ඔබට ලැබෙනු ඇත.

**කාළගෝල නාට්‍යයේ පිටපත ප්‍රතිභාපූර්ණ නාඩගම් රචකයෙක් වූ චාල්ස් සිල්වා ගුණසිංහයන් අතින් ලියැවී ඇත.චාල්ස් සිල්වා ගුණසිංහ ගුරුන්නාන්සේ යනුවෙන් ඔහු හැඳින්වීය.මොහු නාට්‍ය කෘති 20ක් පමණ රචනා කොට ඇති අතර රාමායනය හරිස්චන්ද්‍ර විදුර සිංහවල්ලි වැනි නාඩගම් ඔහු නිර්මාණය කොට ඇත.**



●අප ප්‍රථමයෙන් දික්තල කාළගෝල නාට්‍ය නිර්මාණයට පාදක වූ කතා වස්තුව පිළිබඳව සොයා බලමු..

මෙහි එන කතා වස්තුව පන්සිය පනස් ජාතක පොතෙහි උම්මග්ග ජාතකයේ දික්තල කාළගෝල ප්‍රශ්ණය යන අතුරු කතාව ඇසුරින් නිර්මාණය වූවකි.මෙහිදී ජාතක තතා කරුවාගේ ප්‍රධාන අරමුණ වූයේ බෝධිසත්ව චරිතයේ  බුද්ධිමත් බව විදහා දැක්වීමයි.ජාතක කතාවේ ප්‍රධාන චරිතය මහෞෂධ පඬිතුමා වුවද දික්තල කාළගෝල කතාවේ ප්‍රධාන චරිතය කාළගෝලට හිමි වෙයි.ජාතක කතාවේ ගැටලුව විසදෙන්නේ **යුක්තිය පසිඳුවා දික්තලා කාළගෝල සමඟ පිටත්කර හැරීමෙනි**.නමුත් නාට්‍යයේ කූටප්‍රාප්තිය සිදුවනු ලබන්නේ මහෞෂධ පඬිවරයා විසින් කාළගෝලයාට සත්‍යඅවබෝධ කර දී කාළගෝල විසින් ම දික්තලාව දික්පිටියාට බාර දී මහා බරකින් නිදහස් වූවකු ලෙස සිය ගම රට බලා යාමෙනි.ජාතක කතාවේ ගැටුම වන්නේ ගැහැණියකගේ චපල බව හා දික්පිටියාගේ වංචාකාරීබවයි.අසරණ කාළගෝල අවසානයේ එම ගැටලුවෙන් ජය ලබයි.නමුත් නාට්‍යයේ ගැටුම වන්නේ නොගැළපෙන විවාහයක් නිසා පීඩා විඳින දික්තල සහ කාළගෝලගේ නිෂ්පල ජීවිතයයි.(දෙමාපියන්ගේ බලපෑම නිසා සිදුවූ)විවාහ ව සිටියද දික්තල කාළගෝලට පෙම් නොකරයි.මේ අතර හමුවන ගැළපෙන පුද්ගලයා වන දික්පිටියා සමඟ පෙමින්

බැදෙන  ඇය ඔහු සමඟ පලා යෑමට සැරසෙයි.(නාට්‍යයේ එන දික්පිටියා අවිවාහක තරුණ පුද්ගලයෙකි.දික්තලාට ද අවශ්‍ය වන්නේ මහමඟදී හමුවන නන්නාදුනන පුද්ගලයෙකුට පෙම් කිරීමට වඩා කාළගෝලගේ කරදරයෙන් බේරී යාමට බව නාඩගම් කරුවා ඉඟි කරනු ලබයි)ජාතක කතාවේ දී පැහැදිලි වන පරිදි සම්මතයෙන් පිට යා නොහැක.නොගැළපෙන විවාහය අකමැත්තෙන් වුවද දරාගත යුතුව ඇත.නමුත් නාට්‍යයේ සම්මතය  අභිබවා සාධාරණත්වය යුක්තිය ඉටු වීගැටුම සම්මතයකට පත්වෙයි.

දික්තල කාළගෝල නාට්‍යයේ නාට්‍ය පෙළ පිළිබඳව මනා වටහා ගැනීමක් පහත සබැඳිය වෙත පිවිසීමෙන් ද ලබා ගත හැකිය.

නාට්‍යයේ තේමාව හා කතා වස්තුව පිළිබඳව පහත සබැඳියෙන් විස්තර ලබා ගත හැක.

https://youtu.be/kStd5S_c65Y

## ●ජාතක කතාවේ සහ නාට්‍යයේ ඇති වෙනස්කම්

| ජාතක කතාවේ කාළගෝල ප්‍රශ්නය | කාළගෝල නාඩගම |
|---|---|
| ජාතක කතාවේ ප්‍රධාන චරිතය මහෞෂධ පණ්ඩිතුමන්ය. | නාට්‍යයේ කාළගෝල චරිතය වටා කතාව ගෙතී ඇත |
| දික්පිටියා ගඟෙන් එගොඩ වන්නට පැමිණි මඟියෙකි. | දික්පිටියා ගඟේ මාලු බාමින් සිටි පුද්ගලයෙකි. |
| දික්පිටියා ගඟෙන් එගොඩ වන්නට පෙර කැවුම් රස බලයි. | දික්පිටියා ගඟෙන් එගොඩදී කැවුම් කන්නට දික්තලා බල කරද්දී කැවුම් කන්නට අකමැත්තක් දක්වයි. |
| අරගල කරමින් මහෞෂධ පණ්ඩිතුමන් සිටි ශාලාව අසලින් යද්දී ගැටුම බලන්නට රැස්ව සිටි ජනයා දැක මහෞෂධ පණ්ඩිතුමන් විසින් ම ඔවුන් කැඳවනු ලබයි. | ධික්පිටියා හා කාළගෝල රණ්ඩු වෙද්දී එතැනට පැමිනෙන චත්තුදත්ත නම් මහෞෂධ ගෝලයා මඟින් ඔවුන්ව මහෞෂධ පණ්ඩිතුමන් වෙත ගෙනයයි. |
| ප්‍රශ්නය විසඳීමෙන් පසුව දික්තලා නැවත කාළගෝලට පවරා දීමෙන් කතාව අවසන් වෙයි. | ආරවුලට හේතු වූ සත්‍ය අසත්‍ය බාවය හෙළි කර ගැනීමෙන් අනතුරුව සත්‍ය තේරුම් ගත් කාළගෝළ විසින් ම ඇයව දික්පිටියාට බාර දෙයි. |
| ජාතක කතාවේ පරමාර්ථය මහෞෂධ පණ්ඩිතුමන්ගේ ප්‍රඥාව විදහා දැක්මයි. | ආලය බලෙන් පවරා ගැනීමක් නොවන බවත් ස්ත්‍රියට ද තමන්ගේ ජීවිතය පිළිබඳව තීරණ ගැනීමට අයිතියක් ඇති බව ද නොගැළපෙන සම්බන්ධයක් තුළ විදවීම අවශ්‍ය නොවන බවත් යන සමාජ හරයන් පෙන්වා දෙයි. |
| දික්තලගේ අකමැත්ත මත විවාහ කර දීම හෝ නොගැළපෙන බව පිළිබඳව අවධානයක් හෝ යොමු නොකරයි. | කාළගෝල හා දෙමාපියන්ගේ කැමැත්ත මත පමනක් සිදු වූ මෙම විවාහය පිළිබඳව දිගින් දිගට ම සාකච්චා කරයි. |
| දික්තල පතිවෘතාව අපහසුවෙන් හෝ ආරක්ෂා නොකිරීම පිළිබඳව ජාතක කතාකරුවාද දකින්නේ ස්ත්‍රියකගේ චපලත්වය ලෙසයි.මනමේ කතාවේ ද මෙවන් ම අවස්ථාවක් ඇත. | නාට්‍යකරුවා ස්ත්‍රිය මත ම වරද පටවන්නේ නැත.ස්ත්‍රියගේ එවැනි තීරණ වලට ඇයගේ ස්ත්‍රීත්වය බලපාන අයුරුද එවැනි තීරණයකට සාධාරණ හේතු ඇති බවද නාඩගම්කරුවා පැහැදිලිකිරීමට උත්සහ දරයි. |

## ☛ දික්තල කාළගෝල නාට්‍යයේ නාඩගම් ශෛලිය ඇතැයි හඳුනාගත හැකි අවස්ථා

නාඩගම් වල දැකිය හැකි පොතේගුරු තෝඩායම වැනි පොතේගුරු පැමිණ කරන පූර්ව ගායනා නාට්‍යයේද දැකගත හැකිය.ගායනා කණ්ඩායම අත්වැල් ගායනයන් සපයයි.පොතේගුරු නලුවන්ගේ ප්‍රධානියාය.නාඩගමේ මෙන් කතාව ඉදිරිපත් කිරීම පාත්‍ර වර්ගයා හඳුන්වාදීම නාට්‍යයේ ද දැකගත හැකිය.නාඩගම් වල දක්නට ලැබෙන ස්ථාවර පාත්‍රයන් සියල්ල ම දක්නට නැතත් බහුබූත කෝළමෙහි පැමිනීම දැකගත හැකිය.සංවාදයන් නාට්‍ය ධර්මී ශෛලියෙන් ඉදිරිපත් කරනු ලබයි.පසුතල දර්ශන දැකගත නොහැකි සේම රංගභාණ්ඩ භාවිතයක්ද සිදු නොවෙයි.නාටකයේ වේදිකාව භාවිතය නාඩගමෙහි මෙන් මද්දල තාලයට අනුව සිදු වෙයි.චරිත හඳුන්වා දීම මෙන් මවටයක් ගොස් ගමන අවසන් වූ බව පෙන්වීම ද නාඩමෙහි එන ලක්ශනයක් ලෙස හැඳින්විය හැකිය.සංවාදයන් ගීතාත්මකව යොදාගෙක ඇති අතර නාටකය අවසානයේ ද නාඩගමෙහි මෙන් මංගලම් සිංදුවෙන් අවසන් වෙයි.

https://youtu.be/LPRGYExdwZI

මෙම සබැඳියට යොමු වීමෙන් දික්තල කාළගෝල නාට්‍ය නරඹා ඉහත කරුණු පිළිබඳව අවබෝධයක් ලබා ගත හැකිය.

**●දික්තල කාළගෝල නාට්‍යයේ නාට්‍ය දෘෂ්ටිය**

නාට්‍ය රචකයෙක් නැතිනම් නාට්‍ය කරුවෙක් තමාගේ ආකල්පයන් සමාජගත කිරීමට තම නාට්‍ය නිර්මාණයන් යොදාගනියි.බොහෝ විට නාට්‍ය කරුවා තමාගේ පුද්ගලික ජීවිතයේ දී විඳින අත්දැකීම් පවා නාට්‍ය නිර්මාණයන්ට පාදක විය හැකිය.ජාතක කතා නිර්මානය වන විට පුරුෂ මූලික සමාජ ක්‍රමය නැතිනම් පීතෘ මූලික සමාජ තත්වයන් එයට බලපෑම් කර ඇති අයුරු ජාතක කතාව විමසා බැලීමේ දී ඔබට පැහැදිලි වනු ඇත.ස්ත්‍රීන්ට ස්වාධීනව අපහසු  අයිතිවාසිකම් හිමි නොවන පරිසරයක සිදුවන කතා පුවත් බොහෝ විට ජාතක කතාවන්ගේ දැකගත හැකිය.දෙමාපියන් තනි කැමැත්තට විවාහ කර දෙනු ලබන දියණියන්ගේ කතා පුවත් බොහෝ අතීත කතාවලදී හමුවෙයි.කාළගෝල කතාවේ දික්තලා මෙන් ම මනමේ කතාවේ මනමේ කුමරියද තම ස්වාමියාට එරෙහි වන අවස්තාවේ දී දුටු දුටුවන් දමඟ උාදරයෙන් බැඳෙන ද්‍රෝහී අණුවන කාන්තාවන්   ලෙස සළකනු දැකගත හැකිය.

නමුත් බුදු දහම ස්ත්‍රීන් දෙස එසේ බලන බවක් නොපෙනෙයි.නමුත් භික්ෂූන් වහන්සේලා විසින් ඉදිරියට ගෙන ආ ජාතක කතා කලාවට ඉහත පැහැදිලි ඒ කාලයේ තිබූ සමාජ වාතාවරණය නිසා ජාතක කතා වල මෙවන් සිද්ධි ඇතුළත් වන්නට ඇති බව සිතිය හැකිය.

ජාතක කතාව එසේ පවතිද්දී මේ ඇසුරින් නිර්මාණයේ යෙදෙන නාඩගම්කරුවා  සිය නාඩගම නූතන සමාජයට ගැළපෙන පරිදි නිර්මාණය කරයි.නූතන සමාජය පැතිරීගිය මානව සබඳතා ඇති ස්ත්‍රීන්ට හිමිවිය යුතු සමතැන පිළිබඳව සාකච්චා කරන ආගම් හා සංස්කෘතික කරුණු පිළිබඳව ප්‍රශ්ණ කරන මානව හිමිකම් පිළිබඳව දැඩි වධානයක් යොමු කරන සමාජයකි.මෙම සමාජයට ජාතක කතා කරුවාගේ දෘෂ්ටිය එතරම් නොගැළපෙන නමුදු නාඩගම්කරුවා කාළගෝලට මෙන් ම දික්තලාට ද ඉටු කරන සාධාරාණත්වය හමුවේ වත්මන් සමාජය මෙම නට්‍ය ආදරයෙන් වැළඳගනී.අසාර්ථක ඒක පාර්ශවික විවාහයක අසතුටින් සිටිනවාට වඩා ඇය පෙම් කරන දික්පිටියාට ම ඇය බාර දී නාට්‍ය අවසන් කරයි.